# 03

# මානව හිමිකම් හා යුතුකම්

**හැඳින්වීම**

මිනිසත්බව ලැබීම නිසා කිසිදු භේදයකින් තොර ව මිනිසාට උපතින් ම හිමි වන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් ලෙස හැඳින්විය හැකි ය. මේ අනුව මානව අයිතිවාසිකම් ගැන දැනුවත් වීම, ඒවා පිළිගැනීම, ගරු කිරීම, මානව හිමිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පැවැත්මට පුරවැසියන්ගේ සුහසිද්ධියට මෙන් ම සාමය, සාධාරණත්වය සමාජය තුළ ස්ථාපිත වීමට ද හේතු වේ. මානව හිමිකම් යන්න මානව අයිතිවාසිකම් යනුවෙන් ද භාවිත කරනු ලැබේ.

සමාජයේ යහපත් පුරවැසියකු ලෙස ජීවත් වීම සඳහා මානව හිමිකම් හා යුතුකම් පිළිබඳ දැනුවත් වීමත්, සමාජ ජීවිතය තුළ ඒවා ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමේ කුසලතා සංවර්ධනය කර ගැනීමත් අත්‍යවශ්‍ය වේ. මෙම පරිච්ඡේදය හොඳින් අධ්‍යයනය කිරීමෙන් ඔබ තුළ එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

## මානව හිමිකම්


මිනිසත්බව ලැබීම හේතු කොට ගෙන පුද්ගලයෙකුට උපතින් ම ලැබෙන අයිතීන් මානව අයිතිවාසිකම් ලෙස හැඳින්විය හැකි ය. මේ අනුව මනුෂ්‍යයන් ලෙස ගරුත්වයෙන් හා සමානාත්මතාවෙන් යුතු ව සමාජයේ ජීවත් වීම සඳහා මානව අයිතිවාසිකම් ඉවහල් වේ.

මිනිසත්බව ලැබීම මෙම අයිතිවාසිකම් හිමි වීමට අවශ්‍ය මූලික හා එක ම සුදුසුකම වේ. අපි මෙය පොදු මනුෂ්‍යත්වය ලෙස හඳුන්වමු. මානව අයිතිවාසිකම් මිනිසාගේ පැවැත්ම මෙන් ම ගරුත්වය ආරක්ෂා කිරීමේ පදනම වන්නේ ය. මානව අයිතිවාසිකම් මැනවින් භුක්ති විඳීමට නොලැබෙන සමාජයක මිනිස් ජීවිත සුරක්ෂිත ව පවත්වා ගෙන යාම මෙන් ම පූර්ණ මානව සංවර්ධනයක් ඇති කර ගැනීම ද දුෂ්කර වේ. මේ අනුව මිනිස් ජීවිතවල පැවැත්ම හා ගරුත්වය ආරක්ෂා වීම සඳහා මානව අයිතිවාසිකම් අත්‍යවශ්‍ය වේ.

එමෙන් ම මානව අයිතිවාසිකම් විශ්වමය සංකල්පයක් වන අතර එය සාධාරණත්වය හා සමානාත්මතා මූලධර්මය මත පදනම් වී තිබීම සුවිශේෂ ලක්ෂණයකි. ජාතිය, ජන

වර්ගය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂභාවය, සමාජ පන්තිය, දරන දේශපාලන මතය ආදී විෂමතා කිසිවක් නොසලකා පොදුවේ සැමට මෙම අයිතිවාසිකම් හිමි වීම එහි ඇති විශේෂත්වයයි.

මානව අයිතිවාසිකම් සුරකින ජන සමාජයක ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත වීම, පුරවැසියන්ගේ සමාජ ජීවිතය වැඩි දියුණු වීම හා සමාජ යුක්තිය හා සාධාරණත්වය වර්ධනය වීම වැනි සාධනීය ලක්ෂණ දක්නට ලැබේ.




3.1 රූපසටහන


## මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා

මානව හිමිකම් සෑම පුද්ගලයකුට ම, කිසිදු භේදයකින් තොර ව උපතින් ම හිමි විය යුතු වුව ද ඉතිහාසයේ විවිධ කාල වකවානුවල අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී විවිධ සීමාවන්ට යටත් වීමට මිනිසාට සිදු විය. වහල් යුගය, වැඩවසම් යුගය එවන් කාල වකවානුවලට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

මිනිස් සමාජය ක්‍රමයෙන් දියුණුවට පත් වන විට අයිතිවාසිකම් පිළිබඳ ව ද මිනිසාගේ අවධානය දැඩි ලෙස යොමු වන්නට විය. මේ නිසා අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා පාලකයන්ට එරෙහි ව සටන් කිරීමට, විවිධ අරගල කිරීමට මෙන් ම පාලකයන් සමග විවිධ ගිවිසුම්වලට එළඹීමට ද සිදු විය. එසේ අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා කිහිපයට නිදසුන් පහත දැක්වේ.

- ක්‍රි.ව. 1215 - බ්‍රිතාන්‍යයේ මැග්නා කාර්ටා ගිවිසුම
- ක්‍රි.ව. 1689 - බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- ක්‍රි.ව. 1776 - ඇමෙරිකානු නිදහස් ප්‍රකාශනය
- ක්‍රි.ව. 1789 - මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
- ක්‍රි.ව. 1917 - රුසියානු විප්ලවය

මේ අනුව පෙනී යන්නේ, නිදහස් ව හා නිවහල් ව ජීවත් වීමට ඇති කැමැත්ත හේතු කොට ගෙන මිනිසා අයිතිවාසිකම් ඉල්ලා සිටීමට පෙලඹෙන බවයි. එම නිසා අයිතිවාසිකම් හා සම්බන්ධ ක්‍රියාවලිය කරුණු දෙකකින් සමන්විත වේ. එය සටහනක් මගින් පහත දක්වා ඇත.




3.2 රූපසටහන -අයිතිවාසිකම් සම්බන්ධ ක්‍රියාවලිය

ක්‍රි.ව. 1914 සිට 1918 දක්වා පැවති පළමුවන ලෝක යුද්ධය නිමාවට පත් ව, දශක දෙකක් ඉක්ම යාමත් සමග දෙවන ලෝක සංග්‍රාමය ආරම්භ විය. දෙවන ලෝක යුද්ධය ක්‍රි. ව. 1939 සිට 1945 දක්වා පැවතුණි. මෙම ලෝක සංග්‍රාමවල ප්‍රතිඵල ඉතා බිහිසුණු විය.

ලෝක සංග්‍රාම නිසා ලක්ෂ සංඛ්‍යාත පිරිසකට ජීවිත අහිමි විය. තවත් විශාල පිරිසක් ආබාධිත තත්ත්වයට පත් විය. කාන්තාවන් සහ ළමුන් මිලියන ගණනක් අනාථභාවයට පත් විය. මිල කළ නොහැකි තරම් වූ දේපළ හානි සිදු විය. එබැවින් මෙම ලෝක සංග්‍රාම මානව අයිතිවාසිකම් බිහිසුණු ලෙස උල්ලංඝනය වූ අවස්ථාවන්ට නිදසුන් ය.

ලෝක සාමය සුරක්ෂිත කිරීම, ජාතීන් අතර සහයෝගය වර්ධනය කිරීම, මානව හිමිකම් සුරැකීම ආදී අවශ්‍යතා කෙරෙහි ලෝක ජනතාවගේ මෙන් ම ලෝක නායකයන්ගේ ද අවධානය යොමු විය. මෙම මෙහෙවර ඉටු කිරීම අරමුණු කර ගෙන ක්‍රි.ව. 1945 දී

එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි විය. මානව හිමිකම් සුරැකීමේ අවශ්‍යතාව කෙරෙහි එක්සත් ජාතීන්ගේ දැඩි අවධානය යොමු වූ අතර 1948 පෙබරවාරි 10 වන දින මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගැනීම මානව හිමිකම් සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් ගනු ලැබූ ඉතා වැදගත් පියවරක් ලෙස හැඳින්විය හැකි ය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1 වන වගන්තිය)

සියලු ම මනුෂ්‍යයෝ නිදහස් ව උපත ලබා ඇත.

ගරුත්වයෙන් හා අයිතිවාසිකම්වලින් සමාන වෙති.

යුක්තිය, අයුක්තිය පිළිබඳ හැඟීමෙන් හා හෘදය සාක්ෂියෙන් යුක්ත ඔවුන්, ඔවුනොවුන්ට සැලකිය යුත්තේ සහෝදරත්වය පිළිබඳ හැඟීමෙනි.

සර්ව සාධාරණ පදනමක් මත සියලු ම මනුෂ්‍යයන්ට අයිතිවාසිකම් හිමි වන බවත්, එම අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී එකිනෙකාගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් පිළිබඳවත් මෙම ප්‍රකාශනයේ ඉතා පැහැදිලි ව කරුණු දක්වා ඇත.

අයිතිවාසිකම් සියලු දෙනාට ම සමාන ව හිමි වන බව පිළිගැනීම, ඒ පිළිබඳ අවබෝධයෙන් හා වගකීමෙන් කටයුතු කිරීම අප සියලු දෙනාගේ ම යුතුකම හා වගකීම වන්නේ ය. අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම පුද්ගල හා සමාජ සංවර්ධනයට ඍජුව ම බලපාන අතර ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපැවැත්ම ද එමගින් තහවුරු වේ. මේ නිසා අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ දැනුවත් වීම මෙන් ම තම පෞද්ගලික හා සමාජ ජීවිතයේ දී ඒවා ප්‍රායෝගික ව ක්‍රියාවට නැඟීමත් අත්‍යවශ්‍ය වේ.

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ප්‍රධාන වශයෙන් පාසල් හා අධ්‍යාපන ආයතන මඟින් පැතිරවීමටත්, ප්‍රදර්ශනය කිරීමටත්, කියවීමට සැලැස්වීම හා පැහැදිලි කරදීමටත් සලස්වන මෙන් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය සාමාජික රාජ්‍යයන්ගෙන් ඉල්ලා තිබේ.

පාසල් සිසුන් වන ඔබ මානව හිමිකම් පිළිබඳ දැනුවත් වීමේ වැදගත්කම මෙම ඉල්ලීමෙන් ඔබට පැහැදිලි වනු ඇත. ඒ පිළිබඳ දැනුවත් වී මෙම අයිතිවාසිකම් මැනවින් භුක්ති විඳීම තුළින් යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීම, සමාජයේ සෙසු සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වීමට මූලික වශයෙන් හේතු වේ. මෙසේ කටයුතු කිරීම තුළින් ප්‍රජාතන්ත්‍රවාදී, යහපත් සාමකාමී ජන සමාජයක පැවැත්ම සහතික කිරීම සඳහා දායක වීමට ඔබට හැකි වනු ඇත.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**ක්‍රියාකාරකම**

- "මානව හිමිකම් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් වීමේ වැදගත්කම" යන මාතෘකාව යටතේ පාසලේ බිත්ති පුවත්පතෙහි පළ කිරීමට සුදුසු ලිපියක් සකස් කරන්න.
- මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා කිහිපයක් තෝරා ගෙන එම අවස්ථාවල දිනාගත් අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු රැස් කරන්න.

## අයිතිවාසිකම් වර්ග කිරීම

අයිතිවාසිකම් යන්න ඉතා පුළුල් සංකල්පයක් වන අතර එම සංකල්පය පහත රූපයේ දැක්වෙන ආකාරයට වර්ග කර දැක්විය හැකි ය.




3.3 රූපසටහන - මානව අයිතිවාසිකම් වර්ග කිරීම

මිනිසුන්ට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු යැයි සැලකෙන මානව හිමිකම් අතුරින් තෝරා ගත් ප්‍රධානතම අයිතීන් ලෝකයේ බොහෝ රටවල් තම මූලික නීතියට ද ඇතුළත් කර තිබේ. ඒවා මූලික අයිතිවාසිකම් ලෙස හැඳින්වේ.

ඒ අනුව සෑම මූලික අයිතිවාසිකමක් ම මානව අයිතිවාසිකමක් වුව ද, සෑම මානව හිමිකමක් ම මූලික අයිතිවාසිකමක් නොවන බව ඔබට පැහැදිලි වනු ඇත. මූලික අයිතිවාසිකම් කඩ වූ අවස්ථාවල දී නීතියේ පිළිසරණ පැතීම සඳහා ද අවස්ථාව හිමි කර දී තිබේ.

ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් සඳහන් කර ඇත. එසේ ම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියා මාර්ග ද දක්වා තිබේ.

මානව හිමිකම් සෑම පුද්ගලයෙකුට ම සමාන ව හිමි වනවා සේ ම, විශේෂිත කණ්ඩායම්වලට සුවිශේෂ වන ලෙස අයිතිවාසිකම් සහතික කිරීම සඳහා එක්සත් ජාතීන් පියවර ගෙන ඇත. කාන්තා හා ළමා අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ගෙන ඇති පියවර ඊට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

මානව හිමිකම්වල ස්වරූපය අනුව ඒවා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් ලෙස වර්ග කර දැක්විය හැකි ය.

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (Universal Declaration of Human Rights - UDHR)

එක්සත් ජාතීන් විසින් 1948 දෙසැම්බර් 10 දින මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කර ගන්නා ලදී. මෙම ප්‍රකාශනය පූර්විකාවකින් සහ වගන්ති 30කින් සමන්විත වේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ අරමුණු, එහි පූර්විකාව අධ්‍යයනය කිරීමෙන් හඳුනා ගත හැකි වේ. එම අරමුණු අතුරින් කිහිපයක් පහත දැක්වේ.

- නීති මඟින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කර දීම අත්‍යවශ්‍ය බව
- ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා තව දුරටත් වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව
- සමාජ ප්‍රගතිය හා වඩා යහපත් ජීවන තත්ත්වයක් උදා කර දීම

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් වගන්ති තුළින් පිළිගැනෙන අයිතිවාසිකම් 30 සරල බසින් පහත දක්වා ඇත.

1. සියලු මනුෂ්‍යයෝ නිදහස් ව උපත ලබති. ඔවුහු ගරුත්වය හා අයිතිවාසිකම්වලින් සමාන වෙති.
2. ජාති, ජන වර්ග, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම්, දේශපාලන ආදී කිසිදු භේදයකින් තොර ව විශ්ව ප්‍රකාශනයේ අයිතිවාසිකම් සැමට සමාන ව හිමි වේ
3. ජීවත් වීමට, සිතීමට හා පෞද්ගලික ආරක්ෂාවට ඇති හිමිකම
4. කිසිවකු වහල්භාවයේ (දාසකමේ) නොයෙදවිය යුතු ය.
5. කිසි ම පුද්ගලයකු වධ හිංසාවට හෝ කෲර, අමානුෂික දඬුවමකට යටත් නොකළ යුතු ය.
6. නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීමේ අයිතිය

7. නීතිය ඉදිරියේ සියල්ලන් ම සමාන බව හා නීතියේ ආරක්ෂාවට සියල්ලන්ට ම හිමිකමක් ඇතිබව

8. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ දී බලධාරී ජාතික අධිකරණයකින් ප්‍රතිකර්ම යොදා ගැනීමේ හිමිකම

9. බලහත්කාරයෙන් අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හෝ පිටුවහල් කිරීම නොකළ යුතු බව

10. තමන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ ව හෝ තමන්ට විරුද්ධ ව යම් අපරාධ චෝදනාවක් පිළිබඳ ව හෝ සාධාරණ හා අපක්ෂපාතී නඩු විභාගයකට ඇති හිමිකම

11. (i) දණ්ඩන වරදක් සම්බන්ධ ව චෝදනා ලැබ සිටින සෑම පුද්ගලයකු ම වරදකරුවකු බව ඔප්පු වන තෙක් නිර්දෝෂී පුද්ගලයකු ලෙස සැලකීම

(ii) දණ්ඩන වරද කළ කාලයේ වලංගු ව පැවති දඬුවමකට වඩා වැඩි දඬුවම් නියම නොකළ යුතු බව

12. පෞද්ගලික රහස්‍යභාවයට ඇති අයිතිය

13. (i) තම රාජ්‍ය සීමාව තුළ නිදහස් ගමනාගමනයට හා පදිංචියට හිමිකම

(ii) විදේශගත වීමට හා තම රටට ආපසු පැමිණීමට ඇති අයිතිය

14. ජීවිත ආරක්ෂාව සඳහා විදේශගත වීමේ හිමිකම

15. සෑම පුද්ගලයකුට ම ජාතිකත්වයට හිමිකම් ඇති බව

16. පවුලක් ඇති කිරීමේ හා පවුල සමාජයෙන් හා රාජ්‍යයේ රැකවරණය ලැබීමේ අයිතිය

17. (i) දේපළ පිළිබඳ අයිතිය

(ii) කිසිවකු සතු දේපළ බලෙන් අහිමි කළ නොහැකි බව

18. සිතීමේ, හෘද සාක්ෂියේ හා ආගමික නිදහස භුක්ති විඳීමේ අයිතිය

19. නිදහස් මතය ප්‍රකාශ කිරීමට, තොරතුරු ලැබීමට හා තොරතුරු දීමට ඇති අයිතිය

20. සාමකාමී ව එක්රැස්වීමේ හා සංගම් පැවැත්වීමේ අයිතිය

21. ඍජුව හෝ නිදහස් ව තෝරා ගත් නියෝජිතයන් මඟින් හෝ රජයට සහභාගි වීමට, ඡන්ද බලයට හා රාජ්‍ය සේවයට අයිතිය

22. සමාජ ආරක්ෂාවේ අයිතිය

23. රැකියාවක් කිරීමට, සාධාරණ වැටුප් ලැබීමට හා වෘත්තීය සමිතිවලට බැඳීමේ අයිතිය

24. නිවාඩු සහ විවේක ගැනීමේ අයිතිය

25. ආහාර, ඇඳුම්, නිවාස හා සෞඛ්‍ය සේවා ආරක්ෂාවට ද සමාජ සේවා ආරක්ෂාව හා රැකවරණයට ද ඇති අයිතිය

26. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ප්‍රාථමික හා මූලික අවස්ථාවල දී පමණක්වත් අධ්‍යාපනය නොමිලේ සැපයිය යුතු ය.

27. සංස්කෘතික, විද්‍යාත්මක හා කලා කටයුතුවලට ඇති අයිතිය

28. මෙම ප්‍රකාශනයෙහි සඳහන් අයිතිවාසිකම් හා ස්වාධීනතා පරිපූර්ණ ව ඉටු කර ගත හැකි සමාජ හා ජාත්‍යන්තර රටාවකට ඇති අයිතිය


29. (i) සෑම පුද්ගලයකු විසින් ම ඉටු කළ යුතු සමාජ යුතුකම් රැසක් ඇති බව

(ii) පුද්ගලයාගේ අයිතිවාසිකම් හා ස්වාධීනතාවන් ක්‍රියාත්මක වීමේ දී සීමාවක් තිබිය හැක්කේ අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා ස්වාධීනතා ආරක්ෂා වීම සඳහා ය.

30. ප්‍රකාශනයෙහි ඇති අයිතිවාසිකම් හා ස්වාධීනතා වැනසී යන අන්දමේ ක්‍රියාකාරකම් නොකළ යුතු බව

ඉහත සඳහන් වූ මානව අයිතිවාසිකම්,

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්
- ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් ලෙස වර්ග කර දැක්විය හැකි ය.




3.4 රූපසටහන - මානව අයිතිවාසිකම් වර්ග

## මානව අයිතිවාසිකම්

### සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්

- ජීවත් වීමට, නිදහස් ව සිටීමට හා පෞද්ගලික ආරක්ෂාවට ඇති අයිතිය
- වහල්භාවයෙන් දසභාවයෙන් නිදහස් ව සිටීමට ඇති අයිතිය
- කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිළිවලින් මිදී සිටීමේ අයිතිය
- සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
- නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීමේ අයිතිය
- ගමනාගමනයට ඇති නිදහස
- විදේශයක ආරක්ෂාව ලැබීමේ අයිතිය
- සිතීමේ හෘද සාක්ෂියේ හා ආගමික නිදහස
- නිදහස් මත දැරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය
- සෘජුව ම හෝ තෝරා ගත් නියෝජිතයකු මගින් තම රටේ පාලනයට සහභාගි වීමට ඇති අයිතිය

### ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම්

- අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
- වැඩ කිරීමට ඇති අයිතිය, සමාන වැඩ සඳහා සමාන වැටුප් ලැබීමට ඇති අයිතිය
- වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට හා ඒවාට සම්බන්ධ වීමට ඇති අයිතිය
- නිවාඩු ලබා ගැනීමේ හා විවේක ගැනීමේ අයිතිය
- ආහාර, ඇඳුම්, නිවාස හා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති අයිතිය
- සංස්කෘතික, විද්‍යාත්මක හා කලා කටයුතුවලට සහභාගි වීමට ඇති අයිතිය
- සමාජ ආරක්ෂණයට ඇති අයිතිය
- පෞද්ගලික දේපළ දැරීමට ඇති අයිතිය
- ප්‍රමාණවත් ජීවන තත්වයක් භුක්ති විඳීමට ඇති අයිතිය

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් අයිතිවාසිකම් සම්බන්ධයෙන් නීත්‍යානුකූල බවක් ඇති කිරීම සහ ඒ පිළිබඳ සාමාජික රටවල අවධානය යොමු කිරීම සඳහා සම්මුතීන් දෙකක් එක්සත් ජාතීන් විසින් 1966 දී සම්මත කර ගන්නා ලදි. එම සම්මුතීන් පහත දැක්වේ.

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය
- ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට සම්බන්ධ ව වෛකල්පික සම්මුතියක් ද සම්මත කර ගනු ලැබිණ. එම ලේඛන පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය**

(International Covenant on Civil and Political Rights - (ICCPR)

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි ඇතුළත් වූ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වෙන ම සම්මුතියක් ලෙස මෙය 1966 දී සම්මත කර ගනු ලැබී ය. මෙම සම්මුතියට සාමාජික රටවල් අත්සන් කොට ස්ථිර කිරීමෙන් පසු තම රට තුළ සම්මුතිය බල ගැන්වීමට එම රටවල් බැඳී සිටී. මෙම සම්මුතිය මඟින් සහතික කර ඇති අයිතිවාසිකම් කිහිපයක් නිදසුන් ලෙස පහත දැක්වේ.

- ජීවත් වීමට ඇති අයිතිය
- කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් හා වධ හිංසාවලින් මිදී සිටීමට ඇති අයිතිය
- අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්වලින් මිදී සිටීමට ඇති අයිතිය
- නීතිය හමුවේ පුද්ගලයෙකු ලෙස පෙනී සිටීමට ඇති අයිතිය
- අතීතයට බලපාන අයුරින් පනවන දඬුවම්වලින් මිදී සිටීමට ඇති අයිතිය
- පෞද්ගලික නිදහසට හා ආරක්ෂාවට ඇති අයිතිය
- වහල්භාවයෙන් මිදී සිටීමට ඇති අයිතිය
- සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
- ආගම් ඇදහීමේ නිදහස
- සාමකාමී ලෙස රැස්වීමේ නිදහස
- මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති අයිතිය
- මහජන නියෝජිතයෙකු ලෙස තෝරා පත් කර ගැනීමට ඇති අයිතිය

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය සමග ම එහි සඳහන් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා වෛකල්පික සම්මුතියක් 1966 දී සම්මත කර ගනු ලැබී ය. එය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පික සම්මුතියයි.

මරණ දඬුවම අහෝසි කිරීමේ අරමුණ ඇති ව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ දෙවන වෛකල්පික සම්මුතිය 1989 දී සම්මත කර ගනු ලැබිණි. මෙම වෛකල්පික සම්මුති දෙක පිළිබඳ විස්තර පහත දැක්වේ.

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පික සම්මුතිය**

(First Optional Protocol to the ICCPR)

මෙම වෛකල්පික සම්මුතිය වගන්ති 14 කින් සමන්විත වේ. මානව හිමිකමක් කඩ වූ විට ඒ සම්බන්ධයෙන් තම රටේ යුක්තිය පසිඳලීමේ කාර්යයන් අවසන් වූ පසු, ඉන් සෑහීමකට පත් නොවන්නේ නම් මෙම සම්මුතිය මඟින් පිහිටුවා ඇති මානව හිමිකම් කමිටුවට පැමිණිලි කිරීමට මෙම වෛකල්පික සම්මුතිය මඟින් අවස්ථාව ලබා දී තිබේ.

මෙසේ පැමිණිලි කිරීමට එම පුද්ගලයා අයත් රට මෙම සම්මුතිය පිළිගෙන ඊට අත්සන් තබා තිබිය යුතු ය. ශ්‍රී ලංකාව මෙම සම්මුතිය පිළිගෙන ඊට අත්සන් තබා ඇත. එබැවි- න් මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් ඉහත කී තත්ත්වයන් යටතේ මානව හිමිකම් කමිටුවට පැමිණිලි කිරීමේ හැකියාව ලැබී තිබේ.

**මරණ දඬුවම අහෝසි කිරීම අරමුණු කොටගෙන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට එකතු කළ දෙවන වෛකල්පික සම්මුතිය**

(Second Optional Protocol to the ICCPR)

1989 දෙසැම්බර් 15 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මෙම සම්මුතිය සම්මත කරනු ලැබී ය. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 3 වන වගන්තිය හා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 6 වන වගන්තියට අතිරේක වශයෙන් මෙය ඉදිරිපත් කර ඇත. මෙම සම්මුතිය වගන්ති 11කින් සමන්විත වේ. මෙම වෛකල්පික සම්මුතිය මඟින් මරණ දඬුවම අහෝසි කිරීමට කටයුතු කර ඇත.

මෙම සම්මුතියට අත්සන් කර, පිළිගන්නා සාමාජික රාජ්‍යයන් කිනම් හෝ වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු වන කිසිදු පුද්ගලයකුට මරණ දඬුවම නියම කිරීම තහනම් කෙරේ. ඒ වෙනුවට වෙනත් විකල්ප දඬුවම් නියම කළ හැකි ය. මෙතෙක් මෙම සම්මුතියට ශ්‍රී ලංකාව අත්සන් තබා නැත.

**ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය**

(International Covenant on Economic, Social and Cultural Rights - (ICESCR)

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් අයිතිවාසිකම් වෙන ම සම්මුතියක් ලෙස ක්‍රියාත්මක කිරීම අරමුණු කරගෙන මෙම සම්මුතිය සම්මත කර ඇත.

අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය, නිදහසේ රැකියාවක් තෝරා ගැනීමට ඇති අයිතිය, වැඩ කිරීමට ඇති අයිතිය, සාධාරණ වැටුපක් ලැබීමට ඇති අයිතිය, වෘත්තීය සංගම් පිහිටුවා ගැනීම හා ඒවාට සම්බන්ධ වීමට ඇති අයිතිය, සමාජයීය ආරක්ෂාව ලැබීමට ඇති අයිතිය, යහපත් ජීවන මට්ටමක් අත් කර ගැනීමට ඇති අයිතිය, තම සංස්කෘතික වටිනාකම් අනුව ජීවත් වීමට ඇති අයිතිය මෙම සම්මුතිය මඟින් පිළිගෙන ඇති අයිතිවාසිකම් කිහිපයකට උදාහරණ වේ.

මෙම සම්මුතිය සාමාජික රටවල් අත්සන් කොට පිළිගැනීමෙන් පසු අදාළ ආර්ථික සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් තම රට තුළ තහවුරු කිරීමට බැඳීමක් ඇති වේ.

## ආර්ථික සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇති කළ වෛකල්පික සම්මුතිය - 2008

(Optional Protocol to the ICESCR)

ආර්ථික සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ ඇතුළත් අයිතීන් තව දුරටත් තහවුරු කිරීම සඳහා එයට සම්බන්ධ වෛකල්පික සම්මුතියක් 2008 වසරේ දී සම්මත කරන ලදී.

## අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනත (International Bill of Rights)

මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, අර්ථ නිරූපණය කිරීම හා සහතික කිරීම සඳහා එක්සත් ජාතීන් විසින් සම්පාදනය කරන ලද ප්‍රධාන නීතිමය ලේඛන 6 ක් පවතී. මෙම ලේඛන සියල්ල එක් ව ගත් විට මානව අයිතිවාසිකම් පිළිබඳ පනත නැමති ලේඛනය නිර්මාණය වේ. ඒ අනුව මානව අයිතිවාසිකම් පනතට අදාළ ලේඛන පහත දැක්වේ.

1. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1948)
2. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)
3. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)
4. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පික සම්මුතිය (1966)
5. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ දෙවන වෛකල්පික සම්මුතිය (1989)
6. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇති කළ වෛකල්පික සම්මුතිය (2008)

## ක්‍රියාකාරකම

- සෑම වසරක ම දෙසැම්බර් 10 වන දිනය ජගත් මානව හිමිකම් දිනය ලෙස සමරනු ලබයි. ඒ නිමිත්තෙන් "අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනත" යන මැයෙන් උදෑසන රැස්වීමට ඉදිරිපත් කිරීමට සුදුසු කෙටි කතාවක් සඳහා සූදනම් සටහනක් පිළියෙළ කරන්න.

ඉහත දී සාකච්ඡා කරන ලද අයිතිවාසිකම් පුද්ගලයන් විසින් තනි තනි ව භුක්ති විඳීම තහවුරු කළ යුතු අතර ඇතැම් පුද්ගල කණ්ඩායම් විසින් කණ්ඩායමක් ලෙස අයිතිවාසිකම් භුක්ති විඳීම තහවුරු කිරීම ද අවශ්‍ය බව වර්තමානයේ දී පිළිගෙන තිබේ. ඒ අනුව සමාජය තුළ විවිධ පීඩාවන්ට පහසුවෙන් ගොදුරු වීමට ඉඩ ඇති පුද්ගල කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර තහවුරු කිරීම සඳහා විවිධ මානව හිමිකම් පිළිබඳ ලේඛන කලින් කලට අන්තර්ජාතික මට්ටමෙන් සම්මත කොට ඇත.

### කාන්තා අයිතිවාසිකම්

ජන සමාජයක කුඩා ම හා මූලික සමාජ ඒකකය වන්නේ පවුලයි. පවුල් ඒකකය තුළ බිරිඳක් මවක, දියණියක හෝ මිත්තනියක වශයෙන් කාන්තාව ඉටු කරන්නේ, මිල කළ නොහැකි තරමේ කාර්යභාරයකි. දරුවන් බිහි කිරීම, ඔවුන් හදවඩා ගැනීම, ඔවුන්ගේ ආරක්ෂාව සැලසීම, ආහාර හා පෝෂණ අවශ්‍යතා ඉටු කිරීම, අධ්‍යාපනය ලබා දීම ආදිය තුළින් පවුලක සුභසිද්ධිය හා සමාජයේ යහපැවැත්ම සඳහා කාන්තාව විසින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

තම පවුලේ කටයුතුවලට මෙන් ම රටක ජාතික ආර්ථිකයට ද කාන්තාව ලබා දෙන ශ්‍රම දයකත්වය අගය කොට සැලකිය යුතු ය. එමෙන් ම සමාජයේ විවිධ භූමිකාවන්ට අයත් වගකීම් උසුලමින් ඉතා වැදගත් සමාජ මෙහෙවරක් ඇය විසින් ඉටු කරනු ලබයි.

ඈත අතීතයේ දී පවා පෙරදිග රටවල කාන්තාව විශේෂ කොට සැලකූ අවස්ථා පිළිබඳ අසන්නට ලැබේ. ක්‍රි.පූ. 6 වන සියවසේ දඹදිව ලිච්ඡවි රජ දරුවන් රාජ්‍ය පාලනයේ දී අනුගමනය කළ සප්ත අපරිහානීය ධර්ම ඊට නිදසුන් ලෙස දැක්විය හැකි ය. සප්ත අපරිහානි ධර්ම තුළ සඳහන් වන ආකාරයට ස්ත්‍රීන්ට රැකවරණය හා ආරක්ෂාව සැපයීම අපරිහානි ධර්මයකි. ඒ අනුව කාන්තාව සම්බන්ධයෙන් ලිච්ඡවි රජ දරුවන් අනුගමනය කළ චාරිත්‍ර ධර්ම පහත දැක්වේ.

- අවිවාහක කුල කුමරියන් ආරක්ෂා කිරීම
- විවාහක කුල කාන්තාවන් ආරක්ෂා කිරීම



3.4 රූපය - කාන්තාවගෙන් ඉටුවන  සමාජ මෙහෙවරින් බිඳක්.

මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී වර්තමානයේ කාන්තාවන්ට සමාජයේ විවිධ වෙනස්කම්වලට මුහුණ දීමට සිදු වන අවස්ථා බොහෝ ය. ප්‍රචණ්ඩත්වයට ලක් වීම, විවිධ අතවරවලට මුහුණ දීම, විවිධ ආකාරයේ වෙනස් කොට සැලකීම්වලට ලක් වීම මෙවන් තත්ත්වයන්ට නිදසුන් ය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් අයිතීන් තව දුරටත් සුරක්ෂිත කිරීමේ අදහසින් කාන්තාව සමාජයේ විශේෂ අවධානයට යොමු විය යුතු කණ්ඩායමක් ලෙස සලකා, "කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW) සම්මත කර ගනු ලැබී ය.

## කාන්තාවන්ට එරෙහි ව සිදු වන සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය - (Convention on the Elimination of All Forms of Discrimination Against Women)

මානව හිමිකම් භුක්ති විඳීමේ දී කාන්තාවන්ට එරෙහි ව සිදු වන සියලු ආකාරයේ වෙනස්කම් සමාජය තුළින් තුරන් කිරීම මෙම සම්මුතියේ මූලික අරමුණ වේ. එක්සත් ජාතීන් විසින් 1979 දෙසැම්බර් 18 දින මෙම සම්මුතිය සම්මත කරනු ලැබිණි. 1981 සැප්තැම්බර් 03 දින සිට මෙම සම්මුතිය ක්‍රියාත්මක විය.

මෙම සම්මුතියේ තුන්වන වගන්තිය පහත දක්වා ඇත. එය හොඳින් අධ්‍යයනය කරන්න.

"පාර්ශ්වකාර රාජ්‍යයන් සියලු ම ක්ෂේත්‍රයන්හි, විශේෂයෙන් දේශපාලන, සමාජයීය, ආර්ථික සහ සංස්කෘතික ක්ෂේත්‍රයන් හි පුරුෂයින් හා සමතාවය මත පදනම් වූ අයිතිවාසිකම් හා මූලික නිදහස භුක්ති විඳීම සහ පිළිපැදීම සහතික කිරීම සඳහා ස්ත්‍රීන්ගේ සම්පූර්ණ දියුණුව හා ප්‍රගතිය සහතික කිරීමට අවශ්‍ය නීති සම්පාදනය ඇතුළු සියලු ම ක්‍රියා මාර්ග ගනු ඇත."

මෙම සම්මුතිය යටතේ කාන්තාවන්ට හිමි අයිතීන් කොටස් කිහිපයක් යටතේ පෙළ ගස්වා ඇත.

- කාන්තාවන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්
- පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම්
- අධ්‍යාපනයට හා පුහුණුවීමට ඇති අයිතිය
- ආර්ථික කටයුතු හා එහි ප්‍රතිලාභවලට ඇති අයිතිය
- සෞඛ්‍යාරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය
- සමාජ වෙනස්කම්වලින් ආරක්ෂා වීමේ අයිතිය

මෙම අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී කාන්තාවට එරෙහි ව වෙනස් කොට සැලකීම තුරන් කිරීම හා පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට සමතාවය පදනම් කොට ගෙන මෙම අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩ සැලසිය යුතු බව අවධාරණය කර ඇත.

10 වන වගන්තිය

"පාර්ශ්වකාර රාජ්‍යයන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරුෂයින් හා සමග සමාන අයිතිවාසිකම් ස්ත්‍රීන්ට ලැබීම සහතික කිරීම සඳහා, වෙනස් ලෙස සැලකීම තුරන් කිරීමට අවශ්‍ය සියලු යෝග්‍ය උපාය මාර්ග ගනු ඇත."

15 වන වගන්තිය

"පාර්ශ්වකාර රාජ්‍යයන් නීතිය ඉදිරියේ ස්ත්‍රීන්ට පුරුෂයින් හා සමග සම තත්ත්වය දෙනු ඇත."

ශ්‍රී ලංකාව 1981 දී මෙම සම්මුතියට අත්සන් තබා පිළිගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත.

- මෙම සම්මුතියට අනුව 1993 දී ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම
- කාන්තා කටයුතු සම්බන්ධයෙන් වෙන ම අමාත්‍යාංශයක් පිහිටු වීම

- කාන්තාවන්ට වන අසාධාරණකම් සොයා බැලීම සඳහා ජාතික කාන්තා කමිටුව පිහිටු වීම
- ගැහැණු ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි ව සිදු කරන වැරදි දණ්ඩනීය අපරාධ වශයෙන් දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කිරීම
- ගැහැණු ළමයින් හා කාන්තාවන්ට ද රැකවරණය සැලසෙන පරිදි ඔවුන්ට එරෙහි ව නිවස තුළ දී සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත සම්මත කිරීම
- සෑම පොලීසියක ම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටු වීම

1999 ඔක්තෝබර් 06 දින සිඩෝ සම්මුතිය (CEDAW) හා සම්බන්ධ වෛකල්පික ගිවිසුමක් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබිණි.

**ක්‍රියාකාරකම**

- මව් ගුණ/ කාන්තා අභිමානය නිරූපණය වන කවි/ගීත රචනා කිහිපයක් එකතු කරන්න.
- "කාන්තා අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධයෙන් සමාජයෙන් ඉටු විය යුතු කාර්යභාරය" මැයෙන් රචනාවක් ලියන්න.

### ළමා අයිතිවාසිකම්

දෙමව්පියන්ට ඇති උතුම් ම වස්තුව දරුවන් ය. රටක මෙන් ම ලෝක ජන සමාජය සතු වටිනා ම සම්පත වන්නේ ළමයින් ය. රටක අනාගත ජීවනාලිය ළමයින් වීම ඊට ප්‍රධාන හේතුවයි. මේ නිසා වඩා යහපත් වර්තමානයක් තුළින් එළදායී අනාගතයකට ළමයින් යොමු කිරීම ඉතා වැදගත් වේ.

ළමයින්ට ඔවුන්ගේ ළමා කාලය තුළ හිමි විය යුතු අයිතිවාසිකම් මැනවින් භුක්ති විඳීමට අවස්ථාව නොලැබී යාම ළමයකුගේ පරිපූර්ණ සංවර්ධනයට බාධාවකි. එම තත්ත්වයන්, ළමයින්ට අනාගතයේ යහපත් පුරවැසියන් ලෙස සමාජයට ප්‍රවේශ වීමට ඇති ඉඩකඩ සීමා කිරීමට හේතු වේ.

ළමා ශ්‍රමිකයන් ලෙස ළමයින් සේවයෙහි යොදවා ගැනීම, ළමයින් විවිධාකාර වූ අපයෝජනයන්ට ලක් වීම, විවිධ ත්‍රස්තවාදී කණ්ඩායම් ළමයින් සොල්දාදුවන් ලෙස යුද කටයුතු සඳහා යොදවා ගැනීම, පැහැර ගෙන යාම, පාසල් නොයැවීම, වධ හිංසාවලට ලක් කිරීම, ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථාවන්ට නිදසුන් ය.

රටවල් තුළ හා රටවල් අතර ඇතිවන යුද ගැටුම්වල දී එම යුද ගැටුම්වලට කිසිසේත් සම්බන්ධයක් නොමැති, විශාල ළමා ජනගහනයක් වධ හිංසාවලට ලක් වීම, දෙමව්පියන් අහිමි වීම නිසා අනාථභාවයට පත් වීම, මිය යාම, මන්දපෝෂණයට ලක් වීම වැනි තත්ත්වයන්ට ගොදුරු වේ. පළමුවන හා දෙවන ලෝක යුද්ධ මෙවන් අවස්ථාවන්ට නිදසුන් ලෙස දැක්විය හැකි ය.



3.5 රූපය - යුද්ධයක දී පීඩාවට පත් ළමුන්

මෙවන් ඛේදනීය තත්ත්වයන්, ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාව කෙරෙහි ලෝක ජනතාවගේ අවධානය ප්‍රබල ලෙස යොමු කිරීමට හේතු සාධක විය.

ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ගනු ලැබූ විවිධ උත්සාහයන් හි මාහැඟි ප්‍රතිඵලයක් ලෙස 1989 නොවැම්බර් මස 20 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සම්මත කර ගැනීම වැදගත් වේ. 1991 සිට ක්‍රියාත්මක වූ මෙම සම්මුතියට ශ්‍රී ලංකාව ද අත්සන් තබා පිළිගෙන ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හා 1924 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනය ඇතුළු වැදගත් අන්තර්ජාතික ලේඛන රැසක් සැලකිල්ලට ගෙන ඇත.

## එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

## United Nation's Convention on the Rights of the Child (CRC)

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පූර්විකාවකින් හා වගන්ති 54 කින් සමන්විත වේ.

මෙම සම්මුතිය සකස් කිරීමේ දී ළමයාගේ පැවැත්ම, ආරක්ෂාව, සංවර්ධනය සහ සහභාගිත්වය යන කරුණු කෙරෙහි සුවිශේෂ අවධානය යොමු කර ඇත.

ළමා අයිතාවාසිකම් ආරක්ෂා කිරීම විශේෂ අරමුණු හතරක් පදනම් කරගෙන සිදුවේ.


එනම්:-

ළමයාගේ
1. ආරක්ෂාව
2. පැවැත්ම
3. සංවර්ධනය
4. සහභාගිත්වය




3.6 රූපය -

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මූලධර්ම හතරක් පදනම් කරගෙන සකස් කර ඇත. සම්මුතියේ සඳහන් වන සෑම අයිතිවාසිකමකට ම මෙම මූලධර්ම හතර අදාළ වේ. එම මූලධර්ම පහත සටහනින් දක්වා ඇත.




3.4 රූපසටහන

**ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය**

I වන වගන්තිය

වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයකු ම ළමයෙකු ලෙස සැලකේ.

දැනට පාසල් අධ්‍යාපනය ලබන ඔබ ද මෙම වයස් සීමාවට අයත් වේ. එබැවින් ඔබට හිමි අයිතිවාසිකම් පිළිබඳ ඔබ මැනවින් දැනුම්වත් විය යුතු ය. එසේ ම ඔබට හිමි අයිතිවාසිකම් මැනවින් භුක්ති විඳිමින් ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීමට ද ඔබ වගබලා ගත යුතු ය.

ළමයින් කිසිදු ආකාරයක වෙනස්කමකට ලක් නොකර මෙම සම්මුතියේ සඳහන් අයිතිවාසිකම්වලට හිමිකම ලැබිය යුතු බව 2 වන වගන්තියේ සඳහන් වේ.

මෙම වගන්තියට අනුව ජාතිය, ජනවර්ගය, ආගම, භාෂාව, දේපළ, අබලතාවය හෝ වෙනත් කිසිදු තත්ත්වයක් යටතේ විශේෂත්වයක් නොමැති ව මෙම අයිතිවාසිකම් සැමට සමාන ව හිමි විය යුතු ය.

ශ්‍රී ලංකාව වැනි බහු සංස්කෘතික ජන සමාජයක් පවතින රටක ජීවත් වන ඔබ සැමට ද සමානාත්මතා පදනම මත මෙම අයිතිවාසිකම් හිමි වේ. එමෙන් ම සෙසු ළමයින් සතු මෙම අයිතීන්ට ගරු කිරීම, ඒවා සුරැකෙන අයුරින් කටයුතු කිරීම ඔබගේ යුතුකම වේ.

3 වන වගන්තිය
ළමයින් සම්බන්ධ ව ක්‍රියා කරන විට දී සහ ඔවුන් පිළිබඳ ගන්නා තීරණවල දී ළමයාගේ උපරිම යහපත සලකා ක්‍රියා කළ යුතු ය.

6 වන වගන්තිය
ජීවත් වීම සඳහා අයිතියක් සෑම ළමයෙකුට ම ඇති බව පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන් පිළිගනියි.

ළමයින් සතු ජීවත් වීමේ අයිතියට ගරු කිරීම සමාජයේ ජීවත් වන සියලු දෙනාගේ ම වගකීමක් වේ. සෑම පුරවැසියකු ම එය තම පෞද්ගලික වගකීමක් හා යුතුකමක් ලෙස සලකා කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. එසේ කටයුතු කිරීම ළමයින් සතු මෙම අයිතිය සුරක්ෂිත වීමට ඉවහල් වේ.

7 වන වගන්තිය
ළමයෙකු උපත ලද විගස ම ලියාපදංචි කරනු ලබිය යුතු අතර, උපතෙහි සිට ම නමක් ලැබීමේ අයිතිය ද, ජාතියක් ලබා ගැනීමේ අයිතිය ද ඔහුට ඇත්තේ ය.

35 වන වගන්තිය
කිනම් කාර්යයක් සඳහා වුව ද කිනම් ආකාරයකින් වුව ද ළමයින් පැහැර ගෙන යෑම, විකිණීම හෝ වෙළඳාම් කිරීම වැළැක්වීමට රාජ්‍යයන් සියලු පියවර ගත යුතුය.

ළමයින් පැහැර ගෙන යාම හෝ බලහත්කාරයෙන් රඳවා තබා ගැනීම නිසා ළමයින් මානසික වශයෙන් පීඩාවට පත් වීම, අධ්‍යාපනයට ඇති අයිතිය අහිමි වීම, දෙමාපිය රැකවරණය හා ආදරය නොලැබීම, සෞඛ්‍ය පහසුකම් අහිමි වීම වැනි දේ ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වීමට සෘජු ව ම බලපායි. මෙවන් අවස්ථාවන්ට ළමයින් භාජනය වීමට ඇති ඉඩකඩ වළක්වා ලීම සමස්ත සමාජයේ ම යුතුකමක් හා වගකීමක් වේ.

28 වන වගන්තිය
අධ්‍යාපනය ලැබීමට සියලු ම ළමයින්ට අයිතියක් ඇත. මූලික අධ්‍යාපනය අනිවාර්ය කිරීමටත් එය නොමිලයේ ලබා දීමට කටයුතු කිරීමත් රජයේ වගකීමකි.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ඔබට ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා නොමිලයේ අධ්‍යාපනය ලබා දීමට රජය පහසුකම් සලසා ඇත. එම අයිතිය ප්‍රයෝජනයට ගෙන හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමටත්, ඔබ ලබා ගත් දැනුම, කුසලතා රටේත්, ජන සමාජයේත් සංවර්ධනය සඳහා කැප කිරීමටත් අධිෂ්ඨාන කර ගන්න. එසේ වුවහොත් එම අයිතිය සම්බන්ධයෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමට ඔබට හැකි වනු ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් සහතික කර ඇති අයිතිවාසිකම් සමූහයක් පහත දක්වා ඇත.

- ප්‍රකාශනයේ නිදහස
- චින්තනයේ, හෘදය සාක්ෂියේ හා ආගමික විශ්වාසයේ නිදහස
- සමාගමයේ අයිතිය
- ළමයාගේ සමාජයීය, අධ්‍යාත්මික, සදාචාරාත්මක වර්ධනය සහ කායික මානසික සෞඛ්‍ය වර්ධනයට හිතකර තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය
- කායික හෝ මානසික වශයෙන් ආබාධ සහිත ළමුන්ට අනෙක් ළමයින් මෙන් හැදෙන්නට වැඩෙන්නට විශේෂ රැකවරණයට හා අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
- සමාජ ආරක්ෂණ වැඩසටහන්වලින් ප්‍රයෝජන ගැනීමට ඇති අයිතිය
- යහපත් ජීවන තත්ත්වයක් ලබා ගැනීමට ඇති අයිතිය
- සෞඛ්‍ය පහසුකම් හා පෝෂණය ලැබීමේ අයිතිය
- සුළු ජන කණ්ඩායම්වලට අයත් ළමයින්ට තම සංස්කෘතිය භුක්ති විඳීමට, ආගම ඇදහීමට හා තම භාෂාව භාවිත කිරීමට ඇති අයිතිය
- ක්‍රීඩා කිරීමට, විනෝදයෙන් සිටීමට, සංස්කෘතික හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීමට ඇති අයිතිය
- තම අධ්‍යාපනයට, සෞඛ්‍යයට හෝ වර්ධනයට හානි වන ලෙස ළමා ශ්‍රමය ප්‍රයෝජනයට ගැනීමෙන් වැළකී සිටීමට ඇති අයිතිය
- මත් ද්‍රව්‍යවලින් ආරක්ෂා වීම

- ලිංගික අපයෝජනයන්, ලිංගික අතවරවලින් හා ලිංගික ක්‍රියාවල යෙදවීමෙන් ආරක්ෂා වීමේ අයිතිය
- යුද්ධමය වාතාවරණයක දී ආරක්ෂාව ලැබීමට හා යුද්ධයට සම්බන්ධ කර ගැනීමෙන්, සොල්දාදුවන් ලෙස බඳවා ගැනීමෙන් වැළකී සිටීමට ඇති අයිතිය

ළමයාගේ උපරිම යහපත සැලසීම වෙනුවෙන් පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් ඉටු කළ යුතු වගකීම් රාශියක් ද දක්වා තිබේ. ඒවායින් කිහිපයක් පහත දැක්වේ.

- ළමයාගේ පැවැත්ම සහ සංවර්ධනය සහතික කිරීම
- පවුල් සම්බන්ධතා ආරක්ෂා කිරීම
- පවුල් පරිසරය අහිමි වූ දරුවන්ට ආරක්ෂාව සැලසීම
- සමාජ සුරක්ෂිතතාව සැලසීම
- ළමයාගේ උපරිම යහපත සැලසෙන අයුරින් නීති ක්‍රියාත්මක කිරීම
- සන්නද්ධ අරගලවලට යොදා නොගැනීම
- අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම

**ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග**

- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම
- ළමයින් සම්බන්ධ සෑම ක්‍රියාවලියකදිම හා ඔවුන් පිළිබඳව ගනු ලබන සෑම තීරණයකදිම "ළමයාගේ උපරිම යහපත" සැලසෙන පරිදි කටයුතු කිරීම
- ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කරන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම
- ළමයින් සම්බන්ධ ක්‍රියා කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම සහ බලය පැවරීම
- පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම
- සෑම පොලීසියක ම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීම සඳහා ළමා හා කාන්තා අංශයක් පිහිටු වීම
- ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිහිටු වීම. (Child Line Sri Lanka - 1929)

## ක්‍රියාකාරකම

- පහත සඳහන් අයිතිවාසිකම් භුක්ති විඳීම වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් සඳහන් කරන්න.

| අයිතිවාසිකම | අයිතිවාසිකම භුක්ති විඳීම සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම් |
|---|---|
| ආගමික විශ්වාසයේ නිදහස | |
| අධ්‍යාපනය ලැබීමේ අයිතිය | |
| වෙනස්කොට නොසැලකීමේ අයිතිය | |
| සමාගමයේ අයිතිය | |

- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ සඳහන් වන ඔබ කැමති අයිතිවාසිකම් 03ක් තෝරා ගෙන එම අයිතිවාසිකම් ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට හේතු වන ආකාරය පැහැදිලි කරන්න.

### ආබාධ සහිත පුද්ගලයන්

සමාජයේ ජීවත් වන සෑම පුද්ගලයෙකු ම එක හා සමාන හැකියාවන්ගෙන් යුක්ත නොවේ. ශාරීරික, මානසික, බුද්ධිමය විවිධතා හෝ වෙනත් ආබාධ සහිත තත්ත්වයේ පසු වන අය ද සමාජයේ අප සමග ජීවත් වෙති. මෙවන් ආබාධ ඇතැම් විට උපතින් ම ඇති වූ ඒවා විය හැකි ය. එසේ නැති නම් පසු ව මුහුණ දෙන තත්ත්වයන් මත ඇති වූ ඒවා විය හැකි ය.

ආබාධ සහිත වුව ද සමාජයේ ජීවත් වන සාමාන්‍ය පුද්ගලයන් මෙන් ඔවුනට ද විශේෂ වූ හැකියා, දක්ෂතා, කුසලතා ඔවුන් සතු ව පවතී. දෘෂ්‍ය ආබාධ සහිත පුද්ගලයන් කලා ක්ෂේත්‍රයන්හි ඉහළ ම දක්ෂතා පෙන්නුම් කරන අවස්ථා පිළිබඳ ව ඔබ අසා තිබිය හැකි ය. එමෙන් ම එවන් අය ඔවුනට විශේෂිත වූ ක්‍රමවේද ඇසුරින් අධ්‍යාපනය සාර්ථක ව නිම කර රට දැය වෙනුවෙන් විශාල සේවාවක් ඉටු කරන අවස්ථා ගැන ද ඔබ දන්නවා විය හැකි ය.

ආබාධ සහිත පුද්ගලයන් හට තම දක්ෂතා වර්ධනය කර ගැනීම තුළින් රටට, ජන සමාජයට විශාල මෙහෙයක් ඉටු කිරීමට හැකියාව ලැබී තිබේ.

ආබාධ සහිත පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට එක්සත් ජාතීන් පියවර ගෙන ඇත. ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (2006) සම්මත කර ගැනීම ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගනු ලැබූ වැදගත්

පියවරක් ලෙස හැඳින්විය හැකි ය. එමෙන් ම ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් ද ආබාධ සහිත ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට පියවර ගෙන ඇත.

ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ගරු කිරීම තුළින් ඔවුනට ගරුත්වයෙන් යුතු තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලබා දීම පුරවැසියන් වශයෙන් අප සැමගෙන් ඉටු විය යුතු යුතුකමකි.

**ක්‍රියාකාරකම**

- ආබාධ සහිත පුද්ගලයන්ගේ ගරුත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් සමාජයෙන් ඉටු විය යුතු යුතුකම් කිහිපයක් දක්වන්න.
- ආබාධ සහිත පුද්ගලයන්ට යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා රජය මඟින් සලසා ඇති පහසුකම් පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.

### ආදිවාසීන් සහ ගෝත්‍රික ජන කොටස්

ආදිවාසීන් ඔවුනට විශේෂිත වූ සංස්කෘතියකට හිමිකම් කියයි. ආහාර, ඇඳුම් පැළඳුම්, සිරිත්විරිත්, භාෂාව, ඇදහිලි ක්‍රම, ජීවන පුරුදු, ආචාර ධර්ම ආදිය එම විශේෂත්වය පිළිඹිඹු කරන සාධකවලට නිදසුන් ය. ඔවුනට ආවේණික නැටුම්, ගැයුම් වැනි කලාවන් ද ඒ අතර වේ.

ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ලෝක කම්කරු සංවිධානය විසින් 1989 දී ආදිවාසී හා ගෝත්‍රික ජනතාව පිළිබඳ සම්මුතිය හඳුන්වා දෙනු ලැබී ය. ඔවුන් ඓතිහාසික වශයෙන් පවත්වා ගෙන ආ රැකියා, භාෂාව, සිරිත්විරිත්, ඇදහිලි ක්‍රම, ජීවන පුරුදු එලෙසින් ම පවත්වා ගෙන යැමට අවශ්‍ය පසුබිම සකස් කර දීම මෙම සම්මුතියේ ප්‍රධාන අරමුණු වශයෙන් වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ජීවත් වන ආදිවාසීන් "වැදි ජනතාව" ලෙස හැඳින්වේ. විශේෂිත කණ්ඩායමක් ලෙස සලකා ආදිවාසීන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩ සලසා දීමත්, එම අයිතිවාසිකම්වලට ගරු කිරීමත් රටක ජීවත් වන සැම පුරවැසියකුගේ ම යුතුකම හා වගකීම වේ.



3.7 රූපය - ආදිවාසීන්

## ක්‍රියාකාරකම

- ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කරන්න.

### වැඩිහිටියන් (ජ්‍යෙෂ්ඨ පුරවැසියන්)

වැඩිහිටියන් යනුවෙන් පිළිගැනීම සඳහා අදාළ ජාත්‍යන්තර මට්ටමෙන් පිළිගත් වයස් සීමාවක් නොමැති වුව ද ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ සේවයෙන් විශ්‍රාම ගන්වන වයස් සීමා අවුරුදු 55-60 අතර පවතී. මෙය ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියකු ලෙස සැලකෙන කඩඉම් වයස ලෙස හැඳින්විය හැකි ය.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තම තරුණ කාලය, රාජ්‍ය සේවකයෙක්, පෞද්ගලික අංශයේ සේවකයෙක්, ස්වයං රැකියාවක නිරත වූ අයෙක් හෝ විදේශ රැකියාවක නිරත වූ අයෙක් ආදී ලෙස රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට තම කාලය හා ශ්‍රමය කැප කළ අයයි. එමෙන් ම ඔවුහු ජන සමාජයේ යහපැවැත්මට විශාල මෙහෙයක් ඉටු කරනු ලැබූ අය වෙති.

මේ අනුව ඔවුන්ට යහපත්, තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලබා දීම රජයේ මෙන් ම ජන සමාජයේ ද යුතුකම හා වගකීම වේ. වැඩිහිටියන් ලෙස ඔවුන්ගේ නිදහස, ස්වාධීනත්වය, රැකවරණය, ගරුත්වය රැකෙන ලෙස ජීවිතය පවත්වා ගෙන යාමට ඉඩකඩ සමාජය තුළ ස්ථාපිත වීම අත්‍යවශ්‍ය වේ. එමෙන් ම ඔවුන්ගේ දැනුම, හැකියා,

අත්දැකීම්, පළපුරුදුකම් සමාජ යහපත සඳහා යොදා ගැනීමට අවස්ථාව ලබා දීම සමාජ යහපතට මෙන් ම, වැඩිහිටියන්ට තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීමට ද ආධාර උපකාර වනු ඇත. එමෙන් ම ඔවුනට සමාජයේ විවිධ කටයුතු සඳහා සහභාගිත්වයට ඇති අයිතිය ද තහවුරු කිරීම හා ඔවුන්ට සවන් දීම ද ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොයෙකුත් සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කර ඇත. වැඩිහිටියන්ට තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා අවස්ථාව සලසා දීම විශේෂයෙන් පවුල් ඒකකයේත්, ජන සමාජයේත් යුතුකමක් හා වගකීමක් වේ.

ආසියානු රටවල් අතුරින් අනාගතයේ දී ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතය ඉහළ අගයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. එනිසා ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු විය යුතු ය.

දේශීය වශයෙන් ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතක් (2000 අංක 09) සම්මත කර ඇත. ජාත්‍යන්තර මට්ටමෙන් ද වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා විශේෂ අවධානය යොමු කර ඇත.

**ක්‍රියාකාරකම**

- පවුලේ සාමාජිකයෙක් වශයෙන්, වැඩිහිටියන්ට තෘප්තිමත් සමාජ ජීවිතයක් ගත කිරීමට අවස්ථාව සලසා දීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් නම් කරන්න.
- වැඩිහිටි සුභසාධනය සඳහා ශ්‍රී ලංකා රජය අනුගමනය කරන ක්‍රියාමාර්ග කිහිපයක් සඳහන් කරන්න.

### කම්කරු අයිතිවාසිකම්

රටක සංවර්ධන ක්‍රියාවලිය තුළ වැඩ කරන ජනතාව විසින් ඉටු කරනු ලබන්නේ ඉතා වැදගත් මෙහෙවරකි. මේ නිසා වැඩ කරන ජනතාව උදෙසා සමාජ සාධාරණත්වය සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. එමෙන් ම සේව්‍ය, සේවක සබඳතා යහපත් අයුරින් පවත්වා ගෙන යාම රටක දියුණුව සඳහා අත්‍යවශ්‍ය වේ.

වැඩ කරන ජනතාව වෙනුවෙන් සමාජ සාධාරණත්වය ඉටු කිරීම අරමුණු කර ගෙන 1919 දී අන්තර්ජාතික කම්කරු සංවිධානය බිහි විය. 1946 සිට අන්තර්ජාතික කම්කරු සංවිධානය එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන්නට විය. අන්තර්ජාතික කම්කරු සංවිධානය කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරමුණු කර ගෙන සම්මුතීන් රාශියක් සම්මත කර තිබේ. ශ්‍රී ලංකාව ද 1948 දී අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සාමාජිකත්වය ලබා ගෙන ඇත. අන්තර්ජාතික කම්කරු සංවිධානය විසින් සම්මත කර ගනු ලැබූ සම්මුතීන් රැසක් ශ්‍රී ලංකාව විසින් ද පිළිගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සේව්‍ය, සේවක දෙපක්ෂය අතර සබඳතා යහපත් අයුරින් පවත්වා ගෙන යාම, කාර්මික සාමය ඇති කිරීම අරමුණු කර ගෙන ශ්‍රී ලංකාව සම්මත කර ක්‍රියාත්මක කරන අණ පනත් කිහිපයක් නිදසුන් ලෙස පහත දක්වා ඇත.

- සාප්පු හා කාර්යාල සේවක පනත
- ප්‍රසූති ආධාර ආඥා පනත
- කාර්මික ආරවුල් පනත
- පඩි පාලක සභා ආඥා පනත
- සේවක අර්ථසාධක අරමුදල් පනත

ඕනෑ ම සේවකයකුට තෘප්තිමත් ව තම සේවාවන් ඉටු කිරීම සඳහා, ජීවත් වීමට සරිලන වැටුප්, නිවාඩු, සේවා සුරක්ෂිතතාව, සමාජ ආරක්ෂාව, සෞඛ්‍ය පහසුකම් ආදි අයිතිවාසිකම් නිසි ලෙස භුක්ති විඳීමට අවස්ථාව තිබිය යුතු ය.

සේවකයන්ට මෙම අයිතිවාසිකම් හිමි වීම, සේව්‍ය, සේවක සබඳතා යහපත් අයුරින් පවත්වා ගෙන යාමටත්, කාර්මික සාමය ඇති කිරීමටත්, ශ්‍රම ඵලදායීතාව ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමටත් හේතු වනු ඇත.

අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් මැනවින් ඉටු කිරීම, කම්කරු අයිතිවාසිකම් තව දුරටත් සුරක්ෂිත වීමට හේතු වේ. එමෙන් ම සේව්‍ය පක්ෂය, සේවකයන් වෙනුවෙන් තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම, තමන් විසින් පවත්වා ගෙන යන කර්මාන්ත, සේවා ආදියේ සාර්ථකත්වය කෙරෙහි බෙහෙවින් බලපානු ඇත. සේව්‍ය, සේවක දෙපක්ෂය අතර මෙලෙස යහපත් සබඳතා ගොඩනැඟීම රටක නිෂ්පාදන ක්‍රියාවලියේ සාර්ථකත්වයට හා රටේ සංවර්ධනයට බෙහෙවින් උපකාරී වේ.

## ක්‍රියාකාරකම

- සේවක අයිතිවාසිකම් කිහිපයක් පහත වගු සටහනේ I තීරුවේ දක්වා ඇත. එම අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් සේවකයන් විසින් ඉටු කළ යුතු යුතුකම් II තීරුවේ සටහන් කරන්න.

| I තීරුව<br>සේවක අයිතිවාසිකම් | II තීරුව<br>සේවකයන් විසින් ඉටු කළ යුතු යුතුකම් |
|---|---|
| පැය අටක සේවා කාලය | |
| සාධාරණ වැටුපක් ලැබීමට අයිතිය | |
| නිවාඩු ලබා ගැනීමට ඇති අයිතිය | |
| වෘත්තීය සමිතියක සාමාජිකත්ව ලැබීමට ඇති අයිතිය | |

## පාරිසරික අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්

අප අවට වටපිටාව පරිසරය ලෙස සරල ව හැඳින්විය හැකි ය. ගොඩබිම, ජලය, වායුගෝලය, පස, ශාක හා සත්ත්වයන් ස්වභාවික පරිසරයට අයත් වේ.

ඈත අතීතයේ සිට ම මිනිසා සිය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා යම් යම් ආකාරයට පරිසරය වෙනස් කිරීමට ක්‍රියා කර ඇත. ජන සංඛ්‍යා වර්ධනය හා මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීමත් සමග නිෂ්පාදන ක්‍රියාවලියේ විශාල වෙනස්කම් සිදු විය. මේ නිසා පරිසර තුලිතතාව පවත්වාගෙන යාමට ප්‍රබල ලෙස බලපෑම් එල්ල වූ අතර ඒවා පරිසරය විනාශ වීමට හෝ දූෂණය වීමට හේතු වී තිබේ. විශේෂයෙන් ම 18 වන සියවසේ ආරම්භ වූ කාර්මික විප්ලවය පරිසරය කෙරෙහි අහිතකර බලපෑම් රැසක් ඇති කළේ ය. මිනිසාට මෙන් ම පරිසරයේ පැවැත්මට ද අයිතියක් තිබේ. ඒ අනුව ගහකොළ, ගංගා, ඇළ දොළ, වැව් පොකුණු, වන සතුන් ආදියේ පැවැත්මට ද අයිතියක් ඇත. මිනිසා ද පරිසරයේ කොටසක් පමණි. ඒ අනුව පරිසරයේ ස්වාභාවික පැවැත්මට ඇති අයිතිය තහවුරු වූ විට පිරිසිදු පානීය ජලය, පිරිසිදු වාතාශ්‍රය දූෂණය නොවූ පරිසරයක ජීවත් වීමට ඇති පහසුකම් සුරක්ෂිත වීම සිදු වේ.

එහෙත් මිනිසාගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ගනු ලබන සංවර්ධන ප්‍රයත්න පරිසර දූෂණය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.

"ධරණීය සංවර්ධනය සඳහා ප්‍රධාන වන්නේ මිනිසා ය. ස්වභාවධර්මය සමග සහයෝගිතාවෙන් කටයුතු කර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමේ සම්පූර්ණ අයිතිය ඔවුනට ඇත.

(පරිසරය හා සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනයේ 3 වන මූලධර්මය)

මෙම මූලධර්මය මඟින් පරිසරය පිළිබඳ මිනිසා සතු අයිතිය මෙන් ම පරිසරය සම්බන්ධයෙන් මිනිසාගෙන් ඉටු විය යුතු යුතුකම් ද අවධාරණය කර ඇත. මේ නිසා පාරිසරික අයිතිවාසිකම් රැක ගැනීමට නම්, මිනිස් සංහතිය විසින් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.

ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම, වනාන්තර හා වන සතුන් ආරක්ෂා කිරීම, අපද්‍රව්‍ය ක්‍රමවත් ව බැහැර කිරීම ආදි කාර්යයන් සම්බන්ධයෙන් තම සදාචාරාත්මක යුතුකම් ඉටු කිරීම හා ඒ පිළිබඳ ව පනවා තිබෙන නීතිවලට අනුකූල ව කටයුතු කිරීම මිනිසා සතු පාරිසරික අයිතීන් ආරක්ෂා කර ගැනීමට හේතු වනු ඇත.

පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන නීතිය වන්නේ, 1980 සම්මත කරන ලද ජාතික පාරිසරික පනතයි. මෙම පනත මඟින් ආවරණය වන ඕනෑ ම ගැටලුවක දී ක්‍රියාත්මක වන කේන්ද්‍රීය ආයතනය වන්නේ මධ්‍යම පරිසර අධිකාරියයි.

පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආයතන/දෙපාර්තමේන්තු කිහිපයකට නිදසුන් පහත දැක්වේ.

- පරිසර අමාත්‍යාංශය
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- භූ විද්‍යා හා පතල් කැනීමේ කාර්යාංශය
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

මෙම ආයතන මගින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන පරිසර ප්‍රමිතීන්ට අනුකූල ව කටයුතු කිරීමත්, පෞද්ගලික ව පරිසර සංරක්ෂණයට දායක වීමත් තුළින් සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය තහවුරු කර ගැනීමට ක්‍රියා කිරීම අප සැමගේ යුතුකම හා වගකීම වේ.

### ක්‍රියාකාරකම

- මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසර දූෂණය සිදු වන අවස්ථා පිළිබඳ පුවත්පත්වල පළවන වාර්තා කිහිපයක් රැස් කරන්න.
- පහත දැක්වෙන වගු සටහන සම්පූර්ණ කරන්න.

| I තීරුව | II තීරුව | III තීරුව | IV තීරුව |
|---|---|---|---|
| පරිසර අංග | දූෂණයට බලපාන මිනිස් ක්‍රියාකාරකම් | දූෂණය නිසා ඇතිවන ප්‍රතිඵල | දූෂණය වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග |
| ජලය | | | |
| ගොඩබිම | | | |
| වායුගෝලය | | | |

### ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධ ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන්හි වර්ධනය

ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවට (1972) මුල් වරට මූලික අයිතිවාසිකම් ඇතුළත් කිරීම මේ සම්බන්ධයෙන් ගනු ලැබූ වැදගත් පියවරක් ලෙස හැඳින්විය හැකි ය. 1972 ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ 18 වන වගන්තියේ මූලික අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන ඇතුළත් වේ.

එහෙත් එම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හෝ අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථාවක ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ සඳහන් වී නැත.

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් ඇතුළත් කර ඇත. තුන් වන පරිච්ඡේදයේ 10 වන ව්‍යවස්ථාවේ සිට 14 ව්‍යවස්ථාව දක්වා ඇතුළත් වන්නේ මූලික අයිතිවාසිකම් ය. ඒවා කෙටියෙන් පහත දැක්වේ.

## මූලික අයිතිවාසිකම්

10 වන ව්‍යවස්ථාව

- සෑම පුද්ගලයකුට ම සිතීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස හා ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය.

11 වන ව්‍යවස්ථාව

- වධ හිංසාවලට හෝ කෲර අමානුෂික, අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.

12 වන ව්‍යවස්ථාව

- නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය.

- කිසි ම පුද්ගලයකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන කිසිදු හේතුවක් මත වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවිය යුත්තේ ය.

13 වන ව්‍යවස්ථාව

- කිසි ම පුද්ගලයකු අත්තනෝමතික ව සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. අතීතයට බලපාන පරිදි දණ්ඩ නීති පැනවීම නොකළ යුත්තේ ය.

14 වන ව්‍යවස්ථාව

- භාෂණයේ නිදහස, නීත්‍යානුකූල රැකියාවක් කිරීමේ නිදහස, සමාගමයේ නිදහස, රට තුළ යාමේ ඊමේ නිදහස, ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ නිදහස

- වෘත්තීය සමිති පිහිටුවීමේ සහ ඒවාට බැඳීමේ නිදහස

- අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහස

## මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 126 වන ව්‍යවස්ථාවේ සඳහන් පරිදි, විධායක හෝ පරිපාලන ක්‍රියාවක් හේතු කොට ගෙන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්න ව තිබීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීම ට හිමිකම් ඇත.
- මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධ පැමිණිලි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත ද ඉදිරිපත් කළ හැකි ය.
- පරිපාලන ක්‍රියාවකින් සිදු වූ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා හෙවත් ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැමිණිලි කළ හැකි ය.

අප මෙයට ඉහත දී සාකච්ඡා කළ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට ඇති කරනු ලැබූ පළමුවන වෛකල්පික සම්මුතියට ශ්‍රී ලංකාව ද, අත්සන් තබා පිළිගෙන ඇති බැවින් මානව හිමිකම් කඩවීමක් සම්බන්ධයෙන් සිදු වන නඩු කටයුත්තක දී දේශීය ප්‍රතිකර්ම අවසන් කොට ඇති විටෙක, ඉන් සෑහීමකට පත් නොවන්නේ නම් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකි ය.

## ශ්‍රී ලංකාවේ මානව හිමිකම් භුක්ති විඳීම පිළිබඳ වර්තමාන තත්ත්වය

පුද්ගලයකුට හිමි වන යම් මූලික අයිතිවාසිකමක්, යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් උල්ලංඝනය කර තිබීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්න ව තිබීම සම්බන්ධයෙන් සහනයක් හෝ පිහිටක් ලබා දෙන මෙන් පෙත්සමක් මගින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටීමට, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අවස්ථාව සලසා දී තිබේ.

මෙසේ ඉදිරිපත් කරනු ලබන පෙත්සම් විභාග කර අපක්ෂපාතී සාධාරණ තීන්දු ලබා දීමටත්, උචිත ප්‍රතිකර්ම සලසා දීමටත් ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියා කරයි. මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය එමගින් සුරක්ෂිත වී තිබේ.

රජයේ නිලධාරීන් විසින් සහ රාජ්‍ය සංස්ථාවල, පළාත් පාලන ආයතනවල හා එවැනි වෙනත් ආයතනවල නිලධාරීන් විසින් සිදු කරන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි නීතියේ විධිවිධානවලට යටත් ව පරීක්ෂා කර බලා වාර්තා කිරීමේ කාර්යභාරය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) වෙත පවරා තිබේ.

මූලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීමට ද පුරවැසියන්ට අවස්ථාව සලසා දී තිබේ. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳ පැමිණිලි විමර්ශනය කර උචිත නිර්දේශ ලබා දීමට මානව හිමිකම් කොමිසම ක්‍රියා කරයි. මෙම ක්‍රියාදමයන් ශ්‍රී ලංකා පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කර දීමට හේතු වේ.

මෙම ක්‍රියාදමයන්ට අමතර ව මානව හිමිකම් හා යුතුකම් ඉටු කිරීම සම්බන්ධයෙන් පුරවැසියන් දැනුවත් කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පාසල් හා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ විෂය නිර්දේශවලට මානව හිමිකම් පිළිබඳ විෂය කොටස් ඇතුළත් කිරීම මගින්, මානව හිමිකම් හා යුතුකම් පිළිබඳ ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කරයි. මානව හිමිකම් ගරු කරන, ඒ හා බැඳුණු යුතුකම් හා වගකීම් ඉටු කරන අනාගත පරපුරක් බිහි කිරීමට මෙම ක්‍රියාමාර්ග හේතු වනු ඇත.

විශ්වවිද්‍යාල හා වෙනත් අධ්‍යාපන ආයතන මගින් පවත්වන පාඨමාලා ඇසුරෙන් ද මානව හිමිකම් හා යුතුකම් පිළිබඳ ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

තව ද නීතිය, සාමය හා මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් හා විවිධ ක්ෂේත්‍රවලට අයත් රාජ්‍ය නිලධාරීන් මානව හිමිකම් පිළිබද දැනුවත් කිරීම සඳහා පුහුණු පාඨමාලා සංවිධානය කර ක්‍රියාත්මක කිරීමට ද පියවර ගෙන ඇත.

මේ අයුරින් මානව හිමිකම් හා යුතුකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් වීම, ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහපැවැත්ම තහවුරු කිරීමට හේතු වනු ඇත.

**ක්‍රියාකාරකම**

- මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ අවස්ථා පිළිබඳ ලැබෙන පෙත්සම් විභාග කොට ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ලබා දී ඇති තීන්දු පිළිබඳ තොරතුරු ඇතුළත් පුවත්පත් වාර්තා කිහිපයක් රැස් කරන්න.
- එම වාර්තා හොඳින් අධ්‍යයනය කරන්න.

## මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමා

මානව අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය සදාචාරාත්මක සංකල්පයක් ලෙස වැදගත් වේ. මානව අයිතිවාසිකම් නිදහස හා සමානාත්මතා පදනම මත සැමට ම භුක්ති විඳීමේ අවස්ථා සම්පාදනය කිරීම සඳහා විවිධ නීතිරීති හා ප්‍රතිපාදන සලසා තිබේ.

එමෙන් ම මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී යම් යම් සීමාවන්ට යටත් වීමට ද සිදු වේ. අනෙක් අයගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අයුරින් මානව අයිතිවාසිකම් භුක්ති විඳීමට කිසිවෙකුටත් හැකියාවක් නැත.

කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත්, එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතු ය.

- හැරල්ඩ් ලැස්කි -

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් භුක්ති විඳීම පිළිබඳ සීමා දක්වා තිබේ.

මේ අනුව ජාතික ආරක්ෂාව, වාර්ගික හා ආගමික සහයෝගිතාව වර්ධනය කිරීම, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම, මහජන සෞඛ්‍ය, සදාචාරය, අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ගරු කිරීම සඳහා අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමා පැනවීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දක්වා තිබේ.

රටේ යුද හෝ සිවිල් අරගල පවතින අවස්ථාවක පොදු යහපත වෙනුවෙන් මාධ්‍ය සඳහා ඇතැම් වාරණ පැනවීමේ හැකියාව රජය සතු වීම එවන් අවස්ථාවකට නිදසුන් ලෙස දැක්විය හැකි ය. රටේ පුරවැසියන් අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ පවතින නීතිමය රාමුව තුළ බව සෑම පුරවැසියකු ම අවබෝධ කර ගත යුතු ය.


## මානව හිමිකම් සුරැකීමෙහි ලා පුරවැසි කාර්යභාරය

ශ්‍රී ලාංකිකයන් ඈත අතීතයේ සිට ම යුතුකම් හා වගකීම ඉටු කිරීම ජීවන පුරුද්දක් ලෙස සලකා කටයුතු කර ඇති බවට ඉදිරිපත් කළ හැකි සාක්ෂි බොහෝ ය. තම පවුලේ සාමාජිකයන්, වැඩිහිටියන් රැක බලා ගැනීම, ඔවුන් වෙනුවෙන් තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම ශ්‍රී ලාංකික ජන සමාජය තුළ අතීතයේ සිට පැවත එන චාරිත්‍රයක් වී ඇත. එමෙන් ම තම ශ්‍රමය, දක්ෂතා, කුසලතා තම මව්බිම වෙනුවෙන් කැප කළ බවට අපේ අතීත සංස්කෘතික උරුම සාක්ෂි දරයි.

පරිසරයේ ඇති සම්පත් භුක්ති විඳීමේ දී පවා ස්වභාවික පරිසරය රැක ගනිමින් මානව කටයුතු පවත්වා ගෙන යාම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා ඇත.

අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක මූලික ලක්ෂණයක් වේ. එසේ යුතුකම් හා වගකීම් ඉටු කිරීම තම අයිතිවාසිකම් තව දුරටත් සුරක්ෂිත වීමට මෙන් ම අන් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා වීමට ද හේතු වේ. තව ද අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක යහ පැවැත්ම මෙන් ම සාමය, සහජීවනය, සමගිය වැනි ගුණාංග සමාජය තුළ ස්ථාපිත වීමට ද හේතු වේ.

අයිතිවාසිකම් හා බැඳුණු පුරවැසි යුතුකම් පහත දැක්වෙන ආකාරයට වර්ග කර දැක්විය හැකි ය.




3.5 රූපසටහන

රටක පවත්නා නීතියට අනුව පුරවැසියකු විසින් ඉටු කළ යුතු යුතුකම් නීතිමය යුතුකම් ලෙස සරල ව හැඳින්විය හැකි ය. රජය විසින් පනවන බදු ගෙවීම, නීති පිළිපැදීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට බැඳී සිටීම, පොදු දේපළ ආරක්ෂා කිරීම, ත්‍රස්තවාදය පිටුදැකීමට ක්‍රියා කිරීම නීතිමය යුතුකම්වලට නිදසුන් ලෙස දැක්විය හැකි ය. නීතිමය යුතුකම් පැහැර හැරීම නීතියට අනුව දඬුවම් ලැබීමට ද හේතු වේ.

පූජක උතුමන්ට ගරු කිරීම, වැඩිහිටියන්ට සැලකීම හා ඔවුන් රැක බලා ගැනීම, ගුරුවරුන්ට සැලකීම, සමාජ සිරිත්විරිත් ගරු කිරීම හා ඒවා පවත්වා ගෙන යාම, පරිසරය සුරැකීම, ජාතික උරුමයන් හා ජාතික සම්පත් සුරැකීම, සංස්කෘතිය සුරැකීම සදාචාරාත්මක යුතුකම්වලට නිදසුන් ය.

මත් ද්‍රව්‍ය භාවිතය දුම්වැටි භාවිතය හා වැරදි චර්යාවලින් වැළකී සිටීම සමාජය පොදුවේ පිළිගනු ලබන සද්චාරිත්‍ර ධර්මයන් ය. ඒවායින් වැළකී යහපත් පුරවැසියෙකු වශයෙන් ආදර්ශවත් ජීවිතයක් ගත කිරීමට සදාචාරාත්මක අයිතියක් පුද්ගලයාට ඇත. එමෙන් ම පුද්ගලයාට මෙන් ම සමාජයට ද හානිකර එවන් ක්‍රියාවන්ගෙන් වැළකී සිටීම යහපත් පුරවැසියෙකු වශයෙන් ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකම් ද වේ. එම ගුණධර්මවල පිහිටා එවන් අයහපත් චර්යාවලින් සමාජය මුදා ගැනීමට කටයුතු කිරීම යහපත් පුරවැසියෙකු වශයෙන් ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකම් වේ. සදාචාරාත්මක යුතුකම් ඉටු නොකිරීම, පුද්ගලයාට ඇති සමාජමය පිළිගැනීම ගිලිහී යාමට මෙන් ම සමාජය තුළ අප්‍රසාදයට ලක් වීමට ද හේතු වේ. සදාචාරාත්මක යුතුකම් මැනවින් ඉටු කිරීම පුද්ගලයකුගේ අභිමානය, ගෞරවය හා සමාජ පිළිගැනීම කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරයි.

**මූලික යුතුකම්**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් මෙන් ම මූලික යුතුකම් පිළිබඳ ව ද සඳහන් වේ. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන ව්‍යවස්ථාවේ මූලික යුතුකම් දක්වා තිබේ. (10 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය පෙළපොතෙහි පළමු වන පරිච්ඡේදයේ (පිටු අංක 24, 25) "පුරවැසියා සතු වගකීම්"පිළිබඳ අධ්‍යනය කළ කරුණුවලට අවධානය යොමු කරන්න.)


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම්

- පහත දැක්වෙන I තීරුවේ පුරවැසියන් විසින් ඉටු කළ යුතු මූලික යුතුකම් කිහිපයක් දක්වා ඇත. එම යුතුකම් සපුරාලීම සඳහා පුරවැසියකු වශයෙන් කළ හැකි කාර්යයන් II තීරුවේ සටහන් කරන්න.

| I තීරුව<br>පුරවැසියකු වශයෙන් ඉටු කළ යුතු මූලික යුතුකම් | II තීරුව<br>එම යුතුකම් සපුරාලීම සඳහා පුරවැසියකු වශයෙන් කළ හැකි කාර්යයන් |
|---|---|
| ජාතික අභිවෘද්ධිය වර්ධනය කිරීම හා ජාතික සමගිය පෝෂණය කිරීම | ---------------------------------------- |
| පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම | ---------------------------------------- |
| තමන් විසින් තෝරා ගනු ලැබූ රැකියාවෙහි හෘදය සාක්ෂියට එකඟ ව නොපිරිහෙලා වැඩ කිරීම | ---------------------------------------- |
| ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් රැක ගැනීම | ---------------------------------------- |

### මානව හිමිකම් සුරැකීමෙහි ලා පුරවැසි කාර්යභාරය

#### පවුලේ සමාජිකයකු ලෙස යුතුකම් ඉටු කිරීම

පුද්ගලයකු උපතත් සමග සාමාජිකත්වය ලබන සමාජ ඒකකය වන්නේ පවුලයි. අපි සියලු දෙනා ම පවුලක සාමාජිකයන් ලෙස ජීවත් වන්නෙමු.

පවුලේ සාමාජිකයකු ලෙස ඔබට භුක්ති විඳීමට ලැබෙන අයිතිවාසිකම් පිළිබඳ සිතා බලන්න. ආහාර හා පෝෂණය, ආදරය හා සෙනෙහස, ආරක්ෂාව හා රැකවරණය, අධ්‍යාපනය ලබා දීම පවුලෙන් ඔබට හිමි වන අයිතිවාසිකම් කිහිපයකට නිදසුන් ය. දෙමව්පියෝ සහ වැඩිහිටියෝ ඔවුන්ගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් ලෙස සලකා ඔබට මෙම අයිතිවාසිකම් භුක්ති විඳීමට පහසුකම් සලසති.

මෙම අයිතිවාසිකම් භුක්ති විඳීම වෙනුවෙන් ඔබ විසින් දෙමව්පියන්, වැඩිහිටියන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීම ඔබේ අයිතිවාසිකම් සුරක්ෂිත වීමට මෙන් ම දෙමව්පියන් හා වැඩිහිටියන්ගේ අයිතිවාසිකම සුරක්ෂිත වීමට ද හේතු වනු ඇත. මෙම යුතුකම්, ඔබෙන් ඉටු විය යුතු සදාචාරාත්මක යුතුකම් සේ සලකා කටයුතු කිරීම ඉතා වැදගත් වේ. මෙසේ තම තමන්ගේ යුතුකම් හා වගකීම්, පවුලේ සාමාජිකයන් ලෙස අන්‍යෝන්‍ය වශයෙන් ඉටු කිරීම පවුල් ඒකකයේ ස්ථාවර පැවැත්මට මෙන් ම පවුලේ අභිවෘද්ධියට ද හේතු වේ. පවුලේ සාමාජිකයන් අතර ඇති බැඳීම් තව දුරටත් තහවුරු වීමට ද මෙම තත්ත්වයන් හේතු වේ.

### පාසලේ සාමාජිකයෙකු ලෙස යුතුකම් ඉටු කිරීම

පවුල් ඒකකය මෙන් ම, පුද්ගලයකුගේ ජීවිතය යහපත් අයුරින් ගොඩනැගීමට දායක වන ඉතා වැදගත් ආයතනය වන්නේ පාසලයි. පාසලේ සාමාජිකයෙකු ලෙස ඔබ භුක්ති විඳින අයිතිවාසිකම් පිළිබඳ සිතා බලන්න.

අධ්‍යාපන පහසුකම් ඔබට නොමිලේ ලබා දීම සඳහා රජය විශාල මුදලක් වැය කරන බව මෙහි දී ඔබේ අවධානය යොමු විය යුතු විශේෂ කරුණකි. අධ්‍යාපනය ලබා දීම ඔබේ දක්ෂතා සහ හැකියා වර්ධනය කිරීම, යහපත් පුරවැසියෙකු ලෙස ඔබ සමාජයට දායාද කිරීම පාසලෙන් සිදු වන සේවාවන් කිහිපයකට නිදසුන් ය. පාසල වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් පිළිබඳ ඔබේ අවධානය යොමු කරන්න. අධ්‍යාපන කටයුතු හොඳින් කර ගෙන යාම, ගුරුවරුන්ට කීකරු වීම, විනය ගරුක වීම, පාසලේ පවත්නා නීතිරීති හා සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම, පාසලේ ඇති සම්පත් ආරක්ෂා කර ගනිමින් ප්‍රයෝජනට ගැනීම ඔබෙන් ඉටු විය යුතු යුතුකම්වලට නිදසුන් ය.

පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට හිමි වන අයිතිවාසිකම් මැනවින් භුක්ති විඳීම, ඔබේ අනාගත ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වේ. අයිතිවාසිකම් භුක්ති විඳිමින් ඔබේ යුතුකම් හා වගකීම් පාසල වෙනුවෙන් ඉටු කිරීම ඔබේ අභිමානය හා ගෞරවය ආරක්ෂා වීමට ද හේතු වේ.

### උසස් අධ්‍යාපන ආයතනයක සාමාජිකයෙකු ලෙස යුතුකම් ඉටු කිරීම

ඔබ උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වූ විට උගත්, බුද්ධිමත් පුරවැසියකු ලෙස අයිතිවාසිකම් භුක්ති විඳිමින් තම යුතුකම් හා වගකීම් මැනවින් ඉටු කිරීමට වග බලා ගත යුතු ය.

උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයෙකු වශයෙන් තම අයිතිවාසිකම් භුක්ති විඳීම මෙන් ම, අන් අයගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන අයුරින් කටයුතු කිරීම කෙරෙහි ද අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. එමෙන් ම හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරත වී, රටට වැඩදායී පුරවැසියෙකු ලෙස සමාජයට ප්‍රවේශ වීමේ අධිෂ්ඨානය ඔබ තුළ තිබිය යුතු ය. උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයෙකු වශයෙන්, පුද්ගලයකු ගත කරන කාලය ඔහුගේ අධ්‍යාපන ජීවිතයේ ඉතා වැදගත් කාල සීමාවක් සේ සැලකිය යුතු ය. එසේ කටයුතු කිරීම තුළින් අධ්‍යාපනය ලබන ආයතනයට කීර්තියක් අත් කර දීමට ඔබට හැකි වනු ඇත. එමෙන් ම ඵලදායී ලෙස අධ්‍යාපනය නිම කිරීම, රට ඔබ වෙනුවෙන් තබා ඇති බලාපොරොත්තු ඉටු කිරීම ද හේතු වනු ඇත.

## රැකියාවක නියුක්ත වීමේ දී ඉටු කළ යුතු යුතුකම්

අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව ඔබ ලබා ගත් අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් අනුව අනාගතයේ රැකියාවක යෙදීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. ඔබ කුමන රැකියාවක නිරත වුව ද ශ්‍රමිකයෙකු වශයෙන්, ශ්‍රමාභිමානයෙන් යුතු ව, කාර්යක්ෂම සේවයක් සමාජය වෙනුවෙන්, රට වෙනුවෙන් ඉටු කිරීම ඔබේ යුතුකමක් ලෙස සැලකිය යුතු ය.

කුමන රැකියාවකින් වුව ද සේවය සැලසෙන්නේ සමාජයටයි. ඔබ කරන රැකියාවට අදාළ කටයුතු අවංක ව, කැපවීමෙන් යුතු ව ඉටු කිරීම සමාජයේ දියුණුවට මෙන් ම රටේ සංවර්ධනයට ද හේතු වේ. ඔබෙන් සේවය ලබන පුද්ගලයන් වෙනුවෙන් උපරිම සේවාවක් ඉටු කිරීම ඔබේ අධිෂ්ඨානය විය යුතු ය.

ඔබ යෙදෙන රැකියාව තුළින් සමාජයට උපරිම සේවයක් සැලසීම, ඔබේ සේවය සමාජයේ ඇගයීමට හා පිළිගැනීමට ලක් වීමට ද හේතු වේ. රටෙන් ඔබට ලැබෙන දෙයට වඩා යමක් ඔබෙන් රටට දයාද කිරීමට අධිෂ්ඨාන කර ගන්න.

### ක්‍රියාකාරකම

- "පාසල් සමාජයේ සාමාජිකයන් ලෙස අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමු." යන මාතෘකාව යටතේ පාසල් බිත්ති පුවත්පතේ පළ කිරීමට සුදුසු ලිපියක් සකස් කරන්න.